9 - වන ශ්‍රේණිය

# විශේෂ නිවාඩු කාලය සඳහා පැවරුම්

## සිංහල භාෂාව හා සාහිත්‍යය

*පෙළ පොත හොඳින් අධ්‍යයනය කරමින් පිළිතුරු සපයන්න*

### I කොටස

➢ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 03 දක්වා සඳහන් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අදහසට වඩාත් සමීප අර්ථය දෙන පදය තෝරන්න.**

01. කවරකු හෝ **අවමානයට** පත්කිරීම සත්පුරුෂ ගුණයක් නොවේ.
1. අවලාදයට 2. අපහාසයට 3. සතුටට 4. උපහාසයට

02. මහා පරාක්‍රමබාහු රජතුමා **ප්‍රතාපවත්** පෙනුමකින් යුක්තය.
1. තේජාන්විත 2. රෞද්‍ර 3. දරදඬු 4. අලංකාර

03. මෙයින් මහත් **උද්දාමයට** පත් ජයදේව මහතා තම මිතුරන්ට ස්තුතිය ප්‍රකාශ කළේය.
1. උඩඟු බවට 2. උදහසට 3. ඉමහත් සතුටට 4. උත්සහයට

**04. පාසල් ගොස් ගෙදර පැමිණි නංගී වහ වහා ආහාර ගත්තයා.**
**මෙම වාක්‍යයේ ක්‍රියා විශේෂණ පදය වනුයේ,**
1. ගොස් 2. පැමිණි 3. වහ වාහා 4. ගත්තාය

**05. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදුණු පදය වන්නේ,**
1. ඖෂධ 2. විශිෂ්ට 3. කාර්යාලය 4. ඓතිහාසික

**06. ''බොහෝ ඇසූ පිරූ තැන් ඇති'' යන වාක්‍යයට ගැළපෙන තනි පදය වන්නේ,**
1. නිශාචර 2. අයෙක් 3. මිනිස්සු 4. ළමයි

**07. ........................ අපේ ගෙට ඇතුළු වී සිටියෝය.**
**මෙම වාක්‍යයේ හිස්තැනට සුදුසු නිත්‍ය බහුවචන පදය දක්වන්න.**
1. ගැහැණු 2. ඊශ්වර 3. අසමසම 4. බහුශ්‍රැත

**08. සන්ධ්‍යාව යන පදයට සමානාර්ථවත් පදය වන්නේ,**
1. රාත්‍රිය 2. රැය 3. සැදෑව 4. පෙරයම

**09. යුගල පදයක් නොවන්නේ,**
1. යාන වාහන 2. බරපතල 3. අඟරදඟර 4. අන්දමන්ද

**10. කරදර පිට කරදර යන්නට ගැළපෙන රූඪිය යන්නේ,**
1. වැල්වටාරාම් 2. සායම යනවා 3. කොරේ පිටට මරේ 4. බහින කලාව

**11. කාන්තාවෝ යන්නෙහි අනුක්ත පදය**
1. කාන්තාව 2. කාන්තාවනි 3. කාන්තාවක 4. කාන්තාවන්

**12. අතිශය යන පදයෙහි ''ශ'' අක්ෂරය,**
1. මූර්ධජ අක්ෂරයකි. 2. තාලුජ අක්ෂරයකි.
3. සඤ්ඤක අක්ෂරයකි. 4. මහප්‍රාණ අක්ෂරයකි.

**13. ''ඉබ්බා අහසින් ගියා වගේ'' යන ප්‍රස්තාව පිරුළ යෙදිය හැකි වඩාත් උචිත අවස්ථාව වනුයේ,**
1. හොඳ මිනිස්සු අතර නරක මිනිස්සු සිටිති. 2. ලැබිය නොහැකි දෙයක් ප්‍රතික්ෂේප කිරීම.
3. වැරදි නොකළ පුද්ගලයෙකු දඬුවමකට ලක්කිරීම. 4. නොකළ යුතු දේට ගොස් විනාශයට පත්වීම.

**14. නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති මහප්‍රාණ අක්ෂර ගණන කීයද?**
1 8 යි. 2. 10 යි. 3. 12 යි. 4. 6 යි.

**15. ''චංචල'' යන පදයෙහි විරුද්ධාර්ථ පදය තෝරන්න.**
1. අශ්වල 2. දුෂ්වල 3. නිශ්චල 4. චල

- **පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.**

16. **සුනීත .................................. සුමධුර ධර්ම දේශනාවක් කළහ.**
   1. නාහිමි  2. නාහිමියන්  3. නාහිමියෝ  4. නාහිමිවරුන්

17. **ගංගාවෝ රට සරු කරමින් මුහුදට ............................**
   1. ගලා බසියි.  2. ගලා බසින්නේය.  3. ගලා බසිති.  4. ගලා යයි.

18. **මා වෙනුවෙන් අම්මා මහත් වෙහෙසට පත් ........................**
   1. වූවෙමි.  2. වෙන්නෙමි.  3. වූවාය.  4. වූවෝය.

19. **කොඩිපෙළ අහසේ ලෙළ ......................................**
   1. දෙති.  2. දෙයි.  3. දෙන්නෝය.  4. දෙන්නීය.

20. **භික්ෂූහු දානය සඳහා වැඩම ..............................**
   1. කරයි.  2. කළහ.  3. කෙරුවේය.  4. කෙරුවෙහි.

## II කොටස

> **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

---

01. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට වඩා නොඅඩු රචනයක් ලියන්න.
   i. ළමා ලෝකය සොඳුරු ලොවක් කරමු.  ii. අසරණයන්ට සරණ වෙමු.
   iii. ජලය අපගේ ජීවයයි.  iv. මා ගිය විනෝද චාරිකාවකින් ලත් අත්දැකීම්.

02. පහත සඳහන් පාඨ කා විසින්, කා හට කුමන අවස්ථාවකදී කියන ලද්දක් දැයි පෙළ පොත ඇසුරෙන් සඳහන් කරන්න.
   i. ඉඳින් මේ සිටුපුත්‍රයාණෝත් රා සොඬහුනම් අපට මහා සැපය.
   ii. පුත. ඔබ බෝසත්වරයෙකි. ඔබට බුදුබව ලැබේවා.
   iii. පහත දැක්වෙන කවි සම්පූර්ණ කරන්න.
   - දුක් විඳ දස මස උසුලා වැදූ දැයි අපේ අම්මා.
   - මල් පිපෙන පොකුණුද
   - මුහුදක කිරි දුන් අම්මා

03. දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉපදුණු රටට අදහන ආගමට සෙට
මොන මොන අන්දමින් මුත් මෙහෙයක් නොකොට
පැටවුණු බරක් මෙන් ලංකා පොළොව පිට
පසුවන එක හොඳද සිංහල පුතකු හට

ගිරිමත පැමිණි එක සර කෙසරිඳු සේවී
සිරිබර පවර ජාතික ආලෙහි ගැවී
හරි පිරිමියෙකු මෙන් වැඩ නොකළොත් ජේවී
සිරිලක් මවට නුඹ ණය ගැතියෙක් වේවී

මගේ රට මගේ ජාතික මගේ ගම
මගේ සත් සිරිත් සහ ජාතික උරුම
මගේ වැරයෙන්ම නිදහස් කොට තැබුම
මගේ යුතුකමය සකලවූ හැම දෙනම

   i. පොළොවට බරක් නොවීමට කළ යුත්තේ කුමක්ද?
   ii. නුඹ සිරිලක් මවට ණය ගැතියෙක් වන්නේ කෙලෙසකද?
   iii. ''ගිරිමත පැමිණි එකසර කෙසරිඳු සේවී'' මෙහි අදහස ලියන්න.
   iv. මගේ ශක්තියෙන් නිදහස් කොට තැබිය යුත්තේ මොනවාද?
   v. මෙම පද්‍ය පන්තියේ අඩංගු මෙම පදවලට සමානාර්ථ පදය බැගින් දක්වන්න. • පවර • ජේවී

04. සඳගලතැන්න ශ්‍රී රාහුල ළමා සමාජයේ දස වැනි සාංවත්සරික උත්සවය 2018 සැප්තැම්බර් මස 1 දින පෙරවරු 9.00 සිට පැවැත්වීමට කාරක සභාව තීරණය කර ඇත. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ප්‍රදේශීය ලේකම්තුමිය සහභාගී වේ. ස්ථානය ලෙස සඳගලතැන්න විදුහල් ක්‍රීඩාංගණය තෝරාගෙන ඇත. ඔබ ළමා සමාජයේ ලේකම් ''උමංගා සුබෝධනී'' ලෙස සිතා ආරාධිතයන් වෙත යැවීමට ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

නැතහොත්

ඔබේ විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා පිරිසිදු ජල ටැංකියක් ලබා දෙන ලෙස ඉල්ලමින් ප්‍රදේශයේ ධනවත් වෙළඳ ව්‍යාපාරිකයෙකුට ලිපියක් ලියන්න. ඔබ විද්‍යාලීය සෞඛ්‍ය හා පෝෂණ සංගමයේ ලේකම් මධුරි සෞම්‍යා යැයි සිතන්න.